# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII — YEAR OF OUR LORD JESUS CHRIST, 2024 NOVEMBER — Issue No. 12


## ශුද්ධවූ බයිබලය

### (හිතෝපදේශ 26:1-10)

01. ග්‍රීෂ්ම කාලයට හිම මෙන්ද, ගොයම් කපන කාලයට වර්ෂාව මෙන්ද, අඥානයෙකුට ගෞරවය නොහොබෙන්ය.

02. ඔබ මොබ යන ගේකුරුල්ලා මෙන්ද, ඉගිලී යන වැහිලිහිණියා මෙන්ද, කාරණයක් නැතුව කරන ශාපය නොවදින්නේය.

03. අශ්වයාට කසයක්ද කොටළුවාට කටකලියාවක්ද අඥානයන්ගේ පිටට ඉපලක්ද වෙත්.

04. නුඹත් අඥානයාට සමාන නොවන පිණිස, ඔහුගේ මෝඩකමේ හැටියට ඔහුට උත්තර නොදෙන්න.

05. අඥානයා තමා ප්‍රඥාවන්තයෙකැයි නොසිතන පිණිස, ඔහුගේ මෝඩකමේ හැටියට ඔහුට උත්තරදෙන්න.

06. අඥානයෙකු අත පණිවිඩ අරින්නා තමාගේ පාද කපා දමා අලාභ විඳින්නේය.

07. කොරෙකුගේ කකුල් වලංගු නැත. අඥානයන්ගේ මුඛයෙන් නික්මෙන උපමාවත් එසේමය.

08. අඥානයෙකුට ගෞරවය දෙන්නා ගල් ගොඩක තබනලද මැණික් පසුම්බිය මෙන්ය. (ඇතැම් පිටපතක: ගල් පටියක ගලක් බඳින්නෙකු මෙනි)

09. අඥානයන්ගේ මුඛයෙන් නික්මෙන උපමාව බේබද්දෙක් අතින් වනන කටුගහක් මෙන්ය.

10. අඥානයෙකු කුලියට ගන්නාද මග යන්නන් කුලියට ගන්නාද සියල්ලන්ට තුවාලකරන දුනුවායෙකු මෙනි.

## එකිනෙකාගේ බර උසුලන්න !

### BEAR EACH OTHER'S BURDEN! (Galatians 6:2)

(ප්‍රධාන කර්තෘ දේවගැති ඒන්ජලින් සෙල්වකුමාරි)



අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔබ සැමට ආසිරි පතමු ! ඔබගේ ප්‍රේමයෙන් කරුණාවත් අප ඉතා අගය කරමු. එසේම 2024 වර්ෂයේ මාස 10 ක් පුරාවටම දෙවියන්වහන්සේගේ කරුණාව හා දයාව අප හා සමඟ තිබූ නිසාද අපි උන්වහන්සේට ස්තුති කරමු. අප උන්වහන්සේගේ දරුවන් වන නිසා උන්වහන්සේ අපට දිගට මඟපෙන්වන අපට උන්වහන්සේගේ කරුණාව සෑහෙන්නේය.

උන්වහන්සේ අපව උන්වහන්සේගේ දරුවන් ලෙස තෝරාගෙන තිබේ කියා දේව වචනය පවසා ඇත. මෙය කොපමණ අනර්ඝ වූ දෙයක්ද? නමුත් අප ඇසීමට අවශ්‍යම වූ ප්‍රශ්නයක් නම්, අපගේ ජීවිතය දෙවියන්වහන්සේගේ කැඳවීමට අනුව තිබෙනවාද? කියාය. ශුද්ධවූ පාවුළු තුමා එපීසයෙහි සභාවට ලියන විටදී මෙසේ ලියයි. ***''...නුඹලා කැඳවනු ලැබූ කැඳවීමට ඔබින ලෙස,.......''*** ***(එපීස 4:1)*** මෙහි තේරුම කුමක්ද? දෙවියන්වහන්සේගේ කැඳවීමට ඔබින ලෙස යන්නෙහි තේරුම කුමක්ද කියා දින ගණනාවක් පුරාම මා මගේ මනසින් සිතුවෙමි.

### සාමය ඇති කරන්නන් : දෙවියන්වහන්සේගේ දරුවන්

මතෙව් 5:9 හි, ''සමාදානය කරන්නෝ ආශිර්වාදලද්දෝය, මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝයයි කියනු ලබන්නෝය.'' කියා සඳහන් කර ඇත. ප්‍රිය සහෝදර සහෝදරිය, දෙවියන්වහන්සේ අපව උන්වහන්සේගේ දරුවන්

....Contd. to page 3




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## *from your dearly beloved brother...*

REACHING NATIONS





"ස්වාමීන් යහපත් බව රස බලා දැනගනිව්, උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන මනුෂ්‍යයා ආශිර්වාදලද්දේය" (ගීතාවලිය 34:8)

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රිය දෙවියන්වහන්සේගේ දරුවනි. අප ඔබ සැමදෙනාටම ස්වාමීන්වහන්සේගේ ගෘහයේ සිට ආශිර්වාදයත්, දියුණවත් වේවා කියා සුබපතනවා. (ගීතාවලිය 118:26)**

අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ බොහෝ අමාරුකම් තුළින් අසනීප තත්ත්වයන් තුළින් ආර්ථික අමාරුකම් තුළින් සේවය කරන්නා වූ සියලුම සහකාර සේවකයෝ නිසා දෙවියන්වහන්සේට ස්තූති කරනවා. දෙවියන්වහන්සේ ඔවුන්ව ආරක්ෂා කරමින් අපිටද මඟ පෙන්වමින් ගෙන යන නිසා ස්වාමීන්වහන්සේට ස්තූතියි. ශුද්ධ පාවුල් තුමා කියන ආකාරයෙන් මිසක් නුඹලා අතරේ ජීවිතයක් නැති වන්නේ නැත. *(ක්‍රියා 27:22)* මොන ප්‍රශ්න තිබුණත් සහකාර සේවකයෝ ශාරීරිකව හොඳ තත්ත්වයට හැරෙනවා දෙවියන්වහන්සේගෙග් වචනය ආකාර අපිව උන්වහන්සේ උසස් කරමින් තබනවා. ධර්මිෂ්ඨයා 7 වරක් වැටුණත් නැගිටින්නේය. *(හිතෝපදේශ 24:16)* එම නිසා නොවැම්බර් මාසයේ දෙවියන්වහන්සේගේ සම්පූර්ණ ආශිර්වාදය ලැබෙන බව අපි විශ්වාස කරනවා.

අපේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන්නා වූ ආචාර්ය මේරිනා බෙවින්, සහෝදරී සචිනි ශොර්න්, පූජක කේ.ආර්. රාජසේකරන්, පූජක රොබම් විලියම් යන තවත් මෙම සඟරාව භාෂා 16 කින් පරිවර්තනය කරන්නා වූ සැම දෙනා නිසාත් සම්බන්ධ කරන අය නිසාත් මුද්‍රණාලයේ සේවය කරන අය නිසාත් ඔවුන් සැම දෙනාගෙම යහපත්කම් නිසාත් දේව කරුණාවෙන් අපි මෙම සංග්‍රහය සැම මාසෙම නොකඩවාම මුද්‍රණය කොට එවන පිණිස යාච්ඤා කරන්න.

එලෙසම අපේ සභාවන් වල නෙහෙමියා බයිබල් විදුහල, ශාන්ත පාවුල් මැට්‍රික්ලේෂන් පාසල, මුද්‍රණාලය, Youtube සේවය, සභා ධර්මදූත මධ්‍යස්ථානය, කාර්යාලය නිසාත් ඔබගේ යාච්ඤාව බලාපොරොත්තු වෙනවා. අපේ සේවාවන් වලට විශාල ආර්ථික අර්බුධයක් ඇති වෙලා තියෙන බැවින් දෙවියන්වහන්සේ මේ ප්‍රශ්නය විසඳන්න කියා විශේෂයෙන් යාච්ඤා කරන්න. ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*
(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✿ BIBLECOR - Postal Courses (3 languages) ✿ YouTube Ministry ✿ Online Courses ✿ Theological Correspondence Courses (2 languages) ✿ Church Planting ✿ Nehemiah Bible Colleges ✿ Gospel Printing Press ✿ Great Commission Partners ✿ St. Paul's Matriculation School ✿ Crusades ✿ Community Development

***1 පිටුවෙන්....***

ලෙස කැඳවා එයට ඔබින ලෙස ජීවත් වෙන්නය කියා පැවසීමෙන් පෙන්නුම් කරන්නේ, අප සමාදානය කරන්නන් විය යුතුය කියාය. දේව දරුවන්ගේ ප්‍රධාන චරිත ලක්ෂණයක් වන්නේ කැළඹීම් ඇති කරන්නාවූ අය නොවී සමාදානය ඇති කරන්නාවූ අය වීමයි.

එපීස 4:2 හි පවසන්නාවූ ආකාරයට අප දෙවියන්වහන්සේගේ දරුවන් හැටියට එකිනෙකාගේ බර උසුලන්නය කියාය. මෙලෙස කිරීමට අප ඉතා යටහත්ව මොලොක් ගුණයෙන් හා ඉවසීමෙන් යුතුව සිටීමට අවශ්‍ය වෙයි. මෙම ගුණාංග අප තුළ තිබිය යුත්තේ ඇඳහිලිවතුන් සමඟ පමණක් නොව නොඇදහිලිවතුන් සමඟත් මේ ආකාරයට ජීවත් විය යුතුය. මෙම වචන ගැන අපට ඉතාම පහසුවෙන් කථා කිරීමට හැකි නමුත් එය ක්‍රියාවට දැමීම ඉතාම අමාරු වෙයි. අපෝස්තුළුවරු යාකෝබ් තුමා, ''අප දේව වචනය අසන්නෝ පමණක් නොවී එම වචනයට අනුව ක්‍රියා කරන්නන් විය යුතුය'' කියා පවසයි.

## එකිනෙකාගේ බර උසුලාගන්න !

කොලොස්සි 3:13 හි අපට මෙසේ පවසයි. ***''එකිනෙකා ගැන ඉවසමින්, යමෙකුට විරුද්ධව යමෙකුගේ කාරණයක් ඇත්නම් එකිනෙකාට කමාවෙයල්ලා, ස්වාමීන්වහන්සේ නුඹලාට කමාවුණාක්මෙන් නුඹලාත් කමාකරපල්ලා.''***

එකිනෙකාගේ බර දරාගැනීමට නම්, අපට කමා කිරීම අවශ්‍යවෙයි. සැබවින්ම කමාවදීමට අවශ්‍ය නම්, අපට ප්‍රේමය අවශ්‍ය වෙයි. එනම්, දෙවියන්වහන්සේගේ ප්‍රේමය නොමැතිව අපට යමෙකුට සම්පූර්ණලෙසම කමාව දීමට හෝ අමතක කිරීමට නොහැකි වෙයි. ''මට මෙලෙස කිරීමට බැහැ, මම මනුෂ්‍යයෙක්'ය කියා ඔබට පැවසීමට හැකිය. මෙසේ පැවසීම තුළින් මට එවැනි දේ කිරීමට අමාරුය. දෙවියන්වහන්සේගේ උදවු හා උපකාරය අපට අවශ්‍ය වෙනු ලබන්නේ මෙවැනි අවස්ථාවේදීය. ප්‍රේමයෙන් සමාවදීම හා එකිනෙකාගේ බර උසුලාගන්න කියා දෙවියන්වහන්සේ පවසා ඇත්තේ එය උන්වහන්සේගේ අදහසක් නොව එය උන්වහන්සේගේ අණ කිරීමක් නිසාය.

දේව වචනයෙහි මෙසේ පවසයි, ***''එකිනෙකාගේ බර උසුලා, එසේ ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථාව සම්පූර්ණ කරපල්ලා.'' (එපීස 6:2)*** ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීමට නම්, අප එකිනෙකා තව කෙනෙකුගේ බර ඉසිලිය යුතුයි. මන්ද සෑම කෙනෙක්ම නොයෙකුත් අමාරුකම් වලට, විවිධ අභියෝගවලට, ආර්ථික ප්‍රශ්න වලට, පාපය සමඟ පොර බැඳීම් වලට, ශාරීරික හා ආත්මික පරීක්ෂාවන් වලට මුහුණ දෙනු ලබයි. මෙවැනි වූ බර අපට තනියට උසුලාගෙන යාමට අපහසු නිසා දෙවියන්වහන්සේ අපට සභා පවුලක් දී තිබේ. අප ක්‍රිස්තුස්වන්සේ තුළ එක් ශරීරයකි. එම ශරීරයේ අප සියලු දෙනාම විවිධ වූ ක්‍රියාවන් ඉටු කරන්නාවූ අවයවයෝය. එක් අවයවයක් දුක්විඳීනම් එය මුළු ශරීරයටම දැනෙයි.

## කුරුසියේ සංකේතය !

අප නිතරම අපගේ අවධානය යොමු කල යුත්තේ දෙවියන්වහන්සේ සමඟ අපගේ සමාදානය සහ සම්බන්ධතාවය පවත්වාගෙන යන පිණිසය. කුරුසියේ සංකේතයෙහි ඇති රේඛා දෙකෙන් සිරස් අතට තිබෙන රේඛාවෙන් දෙවියන්වහන්සේ සමඟ තිබෙන අපගේ සම්බන්ධතාවයත් තිරස් අතට තිබෙන්නාවූ රේඛාවෙන් අන් අය සමඟ තිබෙන අපගේ සම්බන්ධතාවයෙන් පෙන්නුම් කරයි.

මේ ආකාරයටම යේසුස්වහන්සේ දුන්නාවූ අණ කිරීම් දෙකෙහිම වැදගත්කමක් ඇත. පළමු අණ නම්, ***''තාගේ මුළු හෘදයෙන්ද තාගේ මුළු ආත්මයෙන්ද තාගේ මුළු බුද්ධියෙන්ද තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේම කරව.'' (මතෙව් 22:37)*** මෙම පදයන් පවසන්නේ, දෙවියන්වහන්සේ සමඟ අපට තිබෙන්නාවූ සම්බන්ධතාවයයි. දෙවනුව, ***''.....තට මෙන් තාගේ අසල්වාසියාට ප්‍රේම කරව යනුයි.''' (මතෙව් 22:39)*** මතෙව් 22:34 - 40 දක්වා ඇති කොටසෙහි අප අන් අය සමඟ තිබෙන සම්බන්ධතාවය ගැන කථා කරයි. (තිරස් රේඛාව)

දෙවියන්වහන්සේ සමඟ අපට තිබෙන්නාවූ සම්බන්ධතාවය ගැන අද බොහෝ දෙනෙකුට දැනෙන්නාවූ කාරණය නම්, අප දෙවියන්වහන්සේට ප්‍රේම කරනවා, සෑම දිනකදීම දේව වචනය කියවා යාච්ඤා කරනවා, නිරාහාරව සිටිනවා, සභාවකට යනවා, සේවය කරනවා යන්නය. මේ ආකාරයට අප ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ගැනද ඉතා උනන්දු වෙයි. පාවුලු තුමා කොරින්ති පොතෙහි මෙසේ පවසයි, ***''....ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන එක්කෙනෙකුට ප්‍රඥාවේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තවත් කෙනෙකුට දැනගැන්මේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට ඇදහිල්ලද එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙක-ට සුව කිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආශ්චර්ය කිරීමද, තවත් කෙනෙකුට ධර්මවාක්‍ය කීමද, වෙන කෙනෙකුට ආත්ම විමසීමද, තවත් කෙනෙකුට නානා වර්ග භාෂාද, තවත් කෙනෙකුට භාෂා තේරුම් කර දීමද දෙන ලද්දේය.'' (1 කොරින්ති 12:8-10)***

නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ එල ගැන අප කුමක් කරනවාද? ගලාති 5:22 - 23 අපට මෙසේ මතක්කර දෙයි. ''....ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්.කම,

කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම....'' මා නිතරම දුටු දෙයක් නම්, මනුෂ්‍යයන් ඔවුන්ගේ සේවය සමඟක් දෙවියන්වහන්සේ සමඟත් තිබෙන්නාවූ සම්බන්ධතාවයත් පවත්වාගෙන යන නමුත් ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් අසල්වාසීන් සමඟ තිබෙන්නාවූ සම්බන්ධතාවය ගැන එතරම් සැලකිල්ලක් නොදක්වයි. නමුත් අප දෙවියන්වහන්සේ සමඟ තිබෙන්නාවූ සම්බන්ධතාවය මෙන්ම අප අන්‍ය සමඟ තිබෙන්නාවූ සම්බන්ධතාවය යන දෙකම පවත්වාගැනීමට අවශ්‍ය බව දේව වචනය පවසයි.

## සභාවේ වගකීම !

ඔබ සහ මම යන අප දෙදෙනාම සභාවට අයිති සාමාජිකයින්ය. සභාව තුල අපට මහත් වගකීමක් තිබේ. සිය ගණන් ඇදහිලිවතුන්ව අප රැකබලා ගත යුතුයි. ශරීරයේ එක් අයෙකු රෝගී වුවහොත් එය අප හැම කෙනෙකුටම බලපෑමක් ඇති කරයි. අන් අයට සැලකීම දැක්වීම යනු ඔවුන්ට කරුණාව පෙන්වීම පමණක් නොව පුද්ගලික ලෙස ඔවුන් මුහුණ දෙනු ලබන්නාවූ ප්‍රශ්න වලදී අප ඒ අයව දරා ගත යුතුයි. අප සමඟ සිටින්නාවූ අය නිරෝගී නම් අපටත් එය ආශිර්වාදයකි. අප නීරෝගී නම් සභාවත් නීරෝගි වෙයි. නමුත් අප කිසියම් වේදනාවක් හෝ දුකක් තුළින් ගමන් කරන්නේ නම්, එය සභාවටද බලපානු ඇත.

ගලාති 6:2 හි ''එකිනෙකාගේ බර උසුලා, එසේ ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථාව සම්පූර්ණ කරපල්ලා,'' මෙම අණ ඉතාම පැහැදිලිය. අප මේ දේ කිරීමෙන් අපව කැඳවූ දෙවියන්වහන්සේගේ කැඳවීමට දේව දරුවන් ලෙස අප ක්‍රියාශීලී අය වෙමුව. දැන් අපි දේව වචනය තුළ සඳහන් කර තිබෙන්නාවූ එකිනෙකාගේ බර දරාගත්තාවූ සමහර පුද්ගලයින්ගේ ජීවිත ගැන උදාහරණ කීපයක් බලමු.

## දාවිත් සහ යොනතාන්

පරාර්ථකාමී ප්‍රේමයකට හා මිත්‍රත්වයට ඇතිඉතාම අනර්ඝවූ උදාහරණය නම් දාවිත් හා යොනතාන් අතර තිබූ බැඳීමයි. දාවිත් මතු දිනකදී රජෙක් ලෙස යොනතාන්ගේ ස්ථානය ගන්නා බව දැන දැනත් ඔහු දාවිත්ට මුළු හදවතින්ම ප්‍රේම කලේය. ඔහුගේ විශ්වාසවන්තකම කෙබඳු එකක්ද කිවහොත් දාවිත් උදෙසා ඔහුගේ පියාට එනම් සාවුල් රජතුමාට පවා විරුද්ධව ඔහු හිටගත්තේය.

1 සාමුවෙල් 23 වන පරිච්ඡේදයෙහි ඉතාම අනර්ඝ වූ දෙයක් නම් මේ සම්බන්ධව සඳහන් කරයි. දාවිත් ශිප් නැමති කාන්තාරයෙහි සැඟවී සිටි විටදී සාවුල් ඔහුව මරණ පිණිස සැඟවී සිටි බව දේව වචනය පවසයි. ***''....සාවුල් හැමදාම ඔහු සෙව්වේය. නුමුත් දෙවියන්වහන්සේ සාවුල් අතට ඔහු පාවා නුදුන්සේක.''*** *(1 සාමුවෙල් 23:14)* දෙවියන්වහන්සේ දාවිත්ව ආරක්ෂා කලේය.

ප්‍රිය මිත්‍රවරුනි, මෙය කොතරම් සැනසීමේ සත්‍යතාවයක්ද ! දෙවියන්වහන්සේ දාවිත්ව ආරක්ෂා කලේය. එලෙසම දෙවියන්වහන්සේ අපගේ සතුරන්ගෙන් අපවද ආරක්ෂා කරන සේක. සතුරා අපට දිගටම පහර දෙන විටදී අන් අය අප වැටෙන තුරු බලා සිටිනවාය කියා අප සිතන්නට පුළුවනි. නමුත් දෙවියන්වහන්සේ අපව සතුරා අතට බාර දෙන්නේ නැත කියා අප බලාපොරොත්තු විය යුතුයි. අපගේ ජීවිත මාර්ගයන් තුලදී අපි දෙවියන්වහන්සේ ප්‍රියා කරනවා නම් උන්වහන්සේ අපිව අපගේ සතුරන් අතට බාර දෙන්නේ නැත. උන්වහන්සේ අපගේ සතුරන්ව අපගේ යහපතට හරවයි. සතුරා අප ළඟින්ම සිටියත් දෙවියන්වහන්සේ හැමදේම පාලනය කරයි. උන්වහන්සේ කිසිම විටෙක ඔවුන්ගේ අතට අපව වැටීමට ඉඩ නොතබයි.

දාවිත් එම මොහොතේ භයෙන් ජීවත් විය. මන්ද සාවුල්ගේ අතින් කොයි මොහොතේ ඔහු මැරෙයිද කියා සිතමින් තනි විය. ඔශුගේ පවුලද නොමැතිව එම මොහොතේදී ඔහු තනි විය. ඔහුගේ නිවසෙහි තිබූ සියලු සැප පසුකම් නැති වී කාන්තාරය තුල සැඟවී සිටීමට සිදු විය. තනිකම ඉතාම භයානක වූ දෙයකි. ඔහුගේ මෙම අඳුරු මොහොතේදී පවා උන්වහන්සේ දාවිත් සමඟ සිටියේය. එසේ උන්වහන්සේ අප සමඟද සිටියි.

මෙම කාන්තාරය තුලදී දාවිත් ශාරීරිකව, මානසිකව හා ආත්මිකව ඉතා අසීරු තත්වයකට පත්ව සිටියදී ඔහුව බැලීමට එම කාන්තාරයට පැමිණියේ, ***''එවිට සාවුල්ගේ පුත්‍ර යොනතාන් නැගිට අවුත් කැලෑවේ සිටි දාවිත් ළඟට ගොස් දෙවියන්වහන්සේ කෙරෙහි ඔහුගේ අත බලවත්කරමින්.''*** *(1 සාමුවෙල් 23:16)*

එනම්, තවත් වචනයකින් පවසනවා නම්, යොනතාන් දෙවියන්වහන්සේ තුළ දාවිත්ව ශක්තිමත් කලේය. ඔහුව ධෛර්‍යමත් කලේය. යොනතාන් කාන්තාරයට යනු ලැබූයේ, ඔහුගේ මිත්‍රවූ දාවිත්ගේ ආත්මය ශක්තිමත් කරන පිණිසය.

*....Contd. to page 6*

**NEHEMIAH RESIDENTIAL BIBLE COLLEGE** Chennai.

ECHO OF HIS CALL 1969-2019 REACHING NATIONS

Rush for Admission!

Diploma in Theology

Medium : Hindi

Qualification : 10th Standard & above

Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years

**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**නොවැ:19**- 2024 - 2025 වසර දක්වා පළමු අධ්‍යයන වාරය සාර්ථකව නිමා කිරීමට හැකිවූ නිසාත් අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලයේ දෙවන අධ්‍යයන වාරය ආරම්භ කිරීමට අපට උපකාර කල නිසා ස්තුති කරන්න.

**නොවැ:20**- අපගේ මුද්‍රණාලය හරහා භාෂා 16 කින් අපගේ සඟරාව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට හා ඒවා අදාල ස්ථාන වලට බෙදා හැරීමට අපට හැකියාව ලබා දුන් නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**නොවැ:21**-අපගේ තැපැල් මාර්ගික පාඨමාලාවට දෙවියන්වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**නොවැ:22**- අපගේ ඉරුදින දේව මෙහෙය, අපගේ ප්‍රධාන සභාව සහ ශාඛා සභාවන් යන දෙකම නිසාත් සුභාරංචිය ලඟා නොවූ කණ්ඩායම් වෙතට ශුභාරංචිය ගෙන යාමට හැකි වූ නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**නොවැ:23**- විවිධ සේවාවන් හරහා ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අපගේ ප්‍රධාන පාලකතුමා කරන කැපවීම නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**නොවැ:24**- අපගේ කැඳවීමේ ප්‍රතිරාවයේ සඟරාවට සහය දක්වන්නාවූ සහකාර සංස්කාරකවරුන් නිසා ස්තුති කරන්න.

**නොවැ:25**- අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායකත්වය දෙන හවුල්කරුවන්, ඇඳහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන්, මහා ආඥාවේ හවුල්කරුවන් හා ඔවුන්ගේ පවුල් නිසා ස්තුති කරන්න.

**නොවැ:26**- අපගේ සේවයට නිතරම උපකාර කරන්නන් හා ඔවුන් සේවයට ක්‍රියාකාරීව දක්වන දායකත්වය නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**නොවැ:27**- අපගේ සබත් පාසැල් සේවයට කැපවී සිටින්නාවූ ගුරුවරුන් නිසා ස්තුති කරන්න.

**නොවැ:28**- අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ YouTube නාලිකාවේ සභාපති වන සහෝදර එඩ්වඩ් දුරෙයි නිසා ස්තුති කරන්න.

**නොවැ:29**- අපගේ කැඳවීමේ ප්‍රතිරාවය YouTube නාලිකාව හරහා ශුභරංචිය නොගිය ප්‍රදේශ වල ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට ස්වාමීන්වහන්සේ අපට උපකාර කර ඇති නිසා ස්තුති කරන්න.

**නොවැ:30**- අපගේ ප්‍රධාන සභාවට හා ශාඛා සභාවන් වලට බොහෝ සබත් පාසැල් දරුවන් ලබා දී අපට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**දෙසැ:01**- අපගේ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේශන් පාසලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ ශිෂ්‍යයින්ට හා ගුරුවරුන්ට දිව්‍යමය ආරක්ෂාව දී ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**දෙසැ:02**- අපට සුභපතන්නන්ට මිත්‍රයින්ට හා ක්ෂේත්‍ර ආධාරකරුවන් නිසා ස්තුති කරන්න.

**දෙසැ:03**- කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුම ක්‍රියාකාරකම් වලට දෙවියන්වහන්සේ ලබා දුන් මඟපෙන්වීම හා ආශිර්වාදයන් නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**දෙසැ:04**- අපගේ ප්‍රධාන පාලකතුමා වන එස්. සැම්. සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සාමාජිකයන්ට සියලුම දුෂ්ඨ බලවේගවලින් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:05**- අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති තුමාගේ ජීවිත කථා පොත සාර්ථකව ලියා නිමකරන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:06**- ලොවපුරා සිටින දේවගැතිවරුන්, මිෂනාරිවරුන් සහ කිතුණු සංවිධාන වලට දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිනිස යාච්ඤා කරන්න.

**දෙසැ:07**- අපගේ සඟරා සභාවේ සාමාජිකයින් උදෙසා යාච්ඤා කරන්න.

**දෙසැ:08**- අපගේ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේශන් පාසලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් උදෙසා යාච්ඤා කරන්න.

**දෙසැ:09**- ලොව පුරා සිටින්නාවූ තරුණ තරුනියන් අතර තිබෙන සියදිවි හානි කර ගැනීමේ ආත්මය ඉවත් කරන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:10**- ලොව පුරා පවතින සුළි කුණාටු සහ භූමිකම්පා වැනි ස්වභාවික විපත් වලින් ආරක්ෂා කරන්න කියා යාච්ඤා කරන්න.

**දෙසැ:11**- අපගේ සභාවේ සාමාජිකයන් උදෙසා යාච්ඤා කරන්න.

**දෙසැ:12**- අපගේ පාසලේ සියලු සාමාජිකයින් උදෙසා යාච්ඤා කරන්න.

**දෙසැ:13**- ලොව පුරා අලුතින් ව්‍යාප්තව පවතින බෝවන රෝග වලට දෙවියන්වහන්සේගේ දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:14**- ලොව පුරා තිබෙන සියලුම කිතුණු සංවිධාන වල විශාල පිබිදීමක් වන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:15**- ලොව පුරා පවතින යුද්ධය සහ ත්‍රස්තවාදයෙන් පීඩනයට පත් වූ සියලු ප්‍රදේශ වල සාමය සහ සහජීවනය නැවත පැමිණෙන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:16**- අපගේ නෙහෙමියා විදුහලේ සියලු සාමාජිකයින් උදෙසා යාච්ඤා කරන්න.

**දෙසැ:17**- බොරු ඉගැන්වීම් සහ බොරු හාස්කම් අනුගමන කිරීමෙන් ඇදහිලිවතුන්ව ආරක්ෂා කර දෙන්න කියා යාච්ඤා කරන්න.

**දෙසැ:18** - අපගේ රෝහල් සේවය නිසා යාච්ඤා කරන්න.

....Contd. from page 4

ඔහු දාවිත් වෙතට ගොස් ධෛර්‍යමත් වචන ඔහුට කථාකොට ඔහුගේ දුර්වල මොහොතේදී ඔහුව ධෛර්‍යමත් කලේය. යොනතාන් දාවිත්ව ශාරීරික ලෙස පමණක් නොව ඔහු ආත්මික ලෙස වැටී සිටින අවස්ථාවේදී දෙවියන්වහන්සේ තුළ ඔහුව ශක්තිමත් කලේය.

***''බය නොවෙන්න, මක්නිසාද මාගේ පියවූ සාවුල්ගේ අතට නුඹ අසුනොවන්නෙහිය, නුඹ ඉශ්‍රායෙල් කෙරෙහි රජවන්නෙහිය. මමද නුඹට දෙවෙනියා වන්නෙමි, මාගේ පියවූ සාවුල්ද ඒ බව දන්නේයයි ඔහුට කීය.'' (1 සාමුවෙල් 23:17)***

දාවිත් ගැන දෙවියන්වහන්සේට තිබෙන්නාවූ සැලැස්ම කුමක්ද කියා යොනතාන් නැවත ඔහුට ස්ථිර කලේය. තමාගේම පියාගේ වැරදි පිළිගෙන දාවිත්ගේ පැත්තෙහි සිටගැනීමට යොනතාන්ට කොතරම් අමරුවූයේද කියා කල්පනා කරන්න. සාවුල් කොතරම් බලවත් රජෙක් වුවත් දෙවියන්වහන්සේගේ සැලැස්මට විරුද්ධව ඔහුට ක්‍රියා කිරීමට බැරි බව යොනතාන් පිළිගත්තේය. එබැවින් දාවිත් ඊළඟ රජු වෙන බව ඔහු කැමැත්තෙන් ප්‍රකාශ කලා පමණක් නොව දාවිත් යටතේ සේවය කිරීමටත් ඔහු කැමති විය. දෙවියන්වහන්සේගේ පොරොන්දුවට එරෙහිව මනුෂ්‍යයාගේ කිසිම සැලැස්මකටවත් පාතාලයේ කිසිම බලවේගයකටවත් සිටගැනීමට බැරිය. අප ගැන දෙවියන්වහන්සේට සැලැස්මක් තිබේ. ***''මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනාය.'' (යෙරමියා 29:11)***

දාවිත්ව ශක්තිමත් කිරීමට යොනතාන් ඔහු සතු සැමදේම අත්හැර ගියේය. එනම් අප තවත් කෙනෙක්ව ධෛර්‍යමත් කිරීමට ඔවුන්ව දෙවියන්වහන්සේ තුළ ශක්තිමත් කිරීම පිණිස ක්‍රියා කරනවාද? තවත් කෙනෙක්ව ශක්තිමත් කරන පිණිස ඔබ අවසාන වරට යමක් කලේ කවදාද? අප බොහෝ විට අපව දිරිගැන්වීමක් සොයමු. නමුත් අපි වෙලාවක් ගෙන අන් අයව ධෛර්‍යමත් කිරීමටත් දෙවියන්වහන්සේ තුළ ශක්තිමත් කිරීමටත් වෑයම් කරනවාද? කාර්‍යබහුල මේ ලෝකය තුළ අන් අයගේ අවශ්‍යතා නොසලකා හැරීම ඉතාම පහසුයි. සමහර විට අපි සිතනවා ඔවුන්ට මුදල් ටිකක් ලබා දුන්නොත් හරි කියා අප සිතමු. මුදල් අවශ්‍ය නමුත් ඊට වඩා පුද්ගලික ලෙස ඔවුන් වෙතට ගොස් ඔවුන්ව හමුවී ඔවුන්ව ශක්තිමත් කිරීම ඉතාම වැදගත්ය.

## බර්සිල්ලයි

දේව වචනය තුළ සඳහන් කර ඇති තවත් චරිතයක් නම් බර්සිල්ලයිය. ඔහු කල ක්‍රියා වලින් අපට පෙනී යන්නේ, තව කෙනෙකුට උපකාර කිරීමට වයස ප්‍රශ්නයක් නොවන බවයි.

2 සාමුවෙල් 19:2 හි මෙසේ පවසයි.

***''බර්සිල්ලයි ඉතා මහලුව අසූ අවුරුද්දක් වයස්ව සිටියේය. ඔහු රජු මහානායිම්හි සිටි කල ඔහුට කන බොන දේ සපයා දුන්නේය. ඔහු ඉතා පොහොසත් මනුෂ්‍යයෙකි.''***

දාවිත් ඔහුගේ මනුෂ්‍යයන් සමඟ තමාගේ පුත්‍රයන්ගෙන් සැඟවෙන පිණිස කාන්තාරයට පලායන විටදී ඔහුට කෑම බීම හා තවත් දේ අවශ්‍යව තිබුණි. ඔහු ඔවුන්ට අවශ්‍ය ආහාර හා පාන ලබා දී දාවිත් සහ ඔහුගේ මනුෂ්‍යයන්ගේ බර උසුලා ගත්තේය.

මෙම සිදුවීමෙන් අපට පෙනෙන්නේ යමෙකුට උදවු උපකාර කිරීමට ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජාතිය හෝ සමාජ තත්වය අවශ්‍ය නැත. තවත් කෙනෙකුගේ බර උසුලා ගැනීම ඉතාම හොඳ දෙයක් නම් තව කෙනෙකුගේ බර උසුලන්නට අපි ආශාවක් හා කැමැත්තක් දැක්විය යුතුයි. දාවිත් රජවූ විය බර්සිල්ලයිව රජ මාලිගාවට කැඳවා ඔහුට උපස්ථාන කිරීමට සූදානම් වූ විටදී ඔහු ඉතා යටහත් පහත්ව එය ප්‍රතික්ෂේප කලේය. ඔහු කිසිම දෙයක් බලාපොරොත්තු නොවී පරාර්ථකාමී ප්‍රේමයෙන් හා පරාර්ථකාමී අදහසින් දාවිත්ගේ වේදනාවේදී හා දුකේදී ඔහුට උදවු කිරීමට තීරණය කර ඒක ක්‍රියාත්මක කලේය.

## යේසුස් වහන්සේ

පරාර්ථකාමී ප්‍රේමයට යේසුස් වහන්සේ හැර වෙන කිසිම ආදර්ශයක් අපට තවත් නැත. උන්වහන්සේ අපට කොතරම් ගැඹුරු ලෙස ප්‍රේමකලද කිවහොත් උන්වහන්සේ තම සිංහාසනය අත්හැර අපගේ පාපය උදෙසා කුරුසියෙහි මැරී උන්වහන්සේගේ ත්‍යාගශීලී ප්‍රේමය පෙන්නුම් කලේය. ***''...ඔබගේ මෑදුකම මා උසස්කලේය.'' (ගීතාවලිය 18:35)*** අප ආශිර්වාද ලබන පිණිස යේසුස් වහන්සේ අපගේ ශාපය දරාගත්තේය. අප හිස ඔසවා ගමන් කරන පිණිස උන්වහන්සේ ලැජ්ජාව තමා පිට දරාගත්තා. උන්වහන්සේගේ මහත් යාගය කරණකොටගෙන අපට කමා කිරීමේ සහ සදාකාලික ජීවනය ලැබුණි. උන්වහන්සේ අපට පොරොන්දු වූයේ ***''....මම කිසිසේත්, නුඹෙන් අහක්ව නොයමි, කිසි අන්දමකින්වත් නුඹ අත් නොහරිමි.'' (හෙබ්‍රෙව් 13:5)*** තවද ස්වාමීන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරයි. ***''ඔහු මා කෙරෙහි ඇලුම්වූ බැවින් ඔහු මුදාහරින්නෙමි. මාගේ නාමය දැන සිටින බැවින් ඔහු උසස් කරන්නෙමි. ඔහු මට යාච්ඤා කරන්නේය. මමද උත්තර දෙන්නෙමි. දුකේදී ඔහු සමඟ සිටින්නෙමි. ඔහු මුදා ගෞරවයට පමුණුවන්නෙමි.'' (ගීතාවලිය 91:14-15)***

එනම් දෙවියන්වහන්සේ අපගේ පීඩා කාලයේදී අප හා සමඟ සිටින බවට පොරොන්දු වෙයි. අපගේ සියලු බර යේසුස් වහන්සේ හා සමඟ බෙදාගන්නවා කියා පවසන්නේ, ***''වෙහෙසවන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි මා වෙතට වරෙල්ලා,***

***මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන මාගෙන් ඉගෙනගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුයයි කීසේක." (මතෙව් 11:28 - 30)***

අපගේ සියලු වේදනාවන් පරාජිතකම් භය යන හැමදේම උන්වහන්සේගේ පාමුල තැබුවහොත් උන්වහන්සේ අප ගැන සලකල සේක. ඔබ අදම උන්වහන්සේගේ පාමුලට එන්න. ඔබගේ සියලු බර උන්වහන්සේට දෙන්න.

යේසුස් වහන්සේ අපගේ බර උසුලන ආකාරයට අපටත් හැකියාවක් තිබිය යුතුයි. අපගේ සභා පවුල් උදෙසා යොනතාන් මෙන් තවත් කෙනෙකුට උපකාරයක් කිරීමට.

## (1). අන් අය උදෙසා යාච්ඤා කිරීම

යාච්ඤාව ඉතා බලවත් ආයුධයක් වන බැවින් අපට එකිනෙකා උදෙසා යාච්ඤා කිරීමට පුළුවනි. කිසියම් කෙනෙක් පාපය නිසා පොරබදනවා නම් ඒ අය ගැන වැරදි කථා නොකර ඔවුන් උදෙසා යාච්ඤා කිරීමට පුළුවනි. ඔබ යම් කෙනෙක් සමඟ අමනාපයකින් සිටී නම් ඔවුන් උදෙසා යාච්ඤා කිරීමට පටන්ගන්න. එකිනෙකා සමඟ ඔවුන් ගැන කථා නොකොට ඔවුන් උදෙසා යාච්ඤා කරන්න.

## (2). ඇහුම්කන්දීම

බොහෝ අවස්ථාවන් වලදී මිනිසුන්ගේ ප්‍රශ්න වලදී ඔවුන්ට අවවාද දීමට වඩා ඔවුන්ගේ ප්‍රශ්නයට ඇහුම්කන්දීමක් ඔවුන් බලාපොරොත්තු වෙයි. කෙනෙක් ඔහුගේ ප්‍රශ්නයට ඇහුම්කන් දෙනවා නම්, ඔවුන් සතුටු වෙයි. අද අප ඇහුම්කන් දෙන්නන්ට වඩා විනිශ්චය ලබා දෙන්නන්ය. මිනිසුන් කරදරයෙන් හා දුකෙන් සිටින විටදී ඔවුන් පවසන්නාවූ දෙයට අප ඉතා ඉවසිලිවන්තව ඇහුම්කන් දිය යුතුය.

## (3). අවශ්‍යතාවයන් සපුරන්න

යාකෝබ්ගේ පොතෙහි අපට උගන්වන්නේ, ඇදහිල්ල ක්‍රියාවෙන් පෙන්වන්න කියාය. යාච්ඤාව හා ඇහුම්කන් දීම පමණක්වත් නොවේ. අප තව කෙනෙකුගේ අවශ්‍යතා උදෙසා ප්‍රායෝගිකව උපකාර කල යුතුය.එය මුදල් ගැන නොවන අතර අපට ඇති හැකියාවෙන් තව කෙනෙකුට මඟපෙන්වීමට හැකිය.

## (4). තාක්ෂණය

ඔබ සතුව ඇති තාක්ෂණය ප්‍රයෝජනවත් ආකාරයෙන් පාවිච්චි කරන්න. කෙනෙක්ව ධෛර්‍යමත් කිරීමේ වචන, හඬ පටියක් ඔවුන් ඉතා අසීරුව සිටින අවස්ථාවන් වලදී ඔවුන්ට යවන්න. ඔවුන්ගේ ප්‍රශ්නකාරී අවස්ථාවන් වලදී ඔවුන් උදෙසා යාච්ඤා කරන්න. හැකිනම් ඔවුන්ට පණිවිඩයක් යවන්න. ඔබ ඔවුන්ගෙන් ඉතා ඈත සිටියත් ඔබ යවන්නාවූ පණිවිඩ බයිබල් පද තුළින් ඔවුන් ඉතා ධෛර්‍යමත් වනු ඇත. එබැවින් ඔබගේ තාක්ෂණය මෙලෙස පාවිච්චි කරන්න.

## (5). සභාවේ සිටින අන් අය ගැන සැලකිලිමත් වෙන්න

ඔබ සභාවේ සිටින්නාවූ අයගේ සැප දුක සොයා බලන්න. යම් කෙනෙක් සභාවට නොපැමිණියේ නම් ඔවුන්ට දුරකථන ඇමතුමක් ලබා දී ඔවුන් ගැන සොයා බලා ඔවුන් වෙනුවෙන් උදවු කිරීමට හා හාච්ඤා කිරීමට පුළුවන් කියා අසන්න. සභාවට පැමිණෙන්නාවූ සියලුම දෙනා ඔබගේ සහෝදර සහෝදරියන් යැයි සිතා ඔවුන් උදෙසා යාච්ඤා කරන්න.

## (6). සේවය කරන්න

යේසුස් වහන්සේ කලාක් මෙන් නිතරම කුමනාකාරයෙන් හෝ තවත් කෙනෙකුට ඔබට කල හැකි උපරිමයෙන් සේවය කරන්න. ප්‍රධාන කාරණය නම්, එකිනෙකාගේ බර උසුලා අපගේ කැඳවීමට අනුව දේව දරුවෙක් ලෙස සේවය කරමු.

************

NEHEMIAH EVENING BIBLE COLLEGE,
Chepauk & Santhoshapuram, Chennai.
ECHO OF HIS CALL 1969-2019 REACHING NATIONS
Rush for admission!
Diploma in Theology
Medium :Tamil
Qualification : 10th Standard & above
Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**''...කියවන්නා තේරුම් ගනීවා....''** *(මතෙව් 24:15)*

## පැන්සල් පෙට්ටිය ගැන පරණ කථාවකි !

*''දරුවෙකු සුදුසු මාර්ගයෙහි පුහුණු කරපන්න, එවිට ඔහු වයස්ගත වූ කලත් එයින් අහක්ව නොයන්නේය.'' (හිතෝපදේශ 22:6)*

මා මගේ ගමේ පිහිට පාසලෙන් 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා අවසන් කර ඉන් පසු ඉහළ ශ්‍රේණි වල අධ්‍යාපනය ලබන පිණිස උසස් පාසලකට මාව ඇතුලත් කලේය. මා ඉංග්‍රීසි අකුරු පළමු වරට ඉගෙනගත්තේ එම පාසලේදීය. පන්තිකාමරයේ සිටි පළමු දවසේදී පන්තිභාර ගුරුතුමිය පැමිණි පසුදින පංතියට පැමිණෙන විට හැමෝම ලිවීමට පොතක් සහ පැන්සලක් ගෙනෙන්නය කියා පැවසීය. මා නැවත නිවසට පැමිණි විටදී මෙය මගේ මවට පැවසීය. මේ දවසේදී මගේ පියා නිවසේ සිටියේ නැත. ඔහු පිට පළාතක වැඩකට ගොස් තිබුනි. ඇය මට පොතක් ගැනීමට මුදල් ලබා දුන් නමුත් පැන්සලක් ගැනීමට එම මුදල් ප්‍රමාණවත් වූයේ නැත. මගේ මව අසල්වාසීන්ගෙන් හා නැදෑයින්ගෙන් මුදල් ලබා ගැනීමට අකමැති වූ නිසා පැන්සලක් ලබා ගන්නා පිණිස යේසුස් වහන්සේට යාච්ඤා කරන්නය කියා පැවසීය.

මා ඇගේ වචනයට කීකරු වී මට පැන්සලක් ලබා දෙන්නය කියා එදින රාත්‍රියේදී යාච්ඤා කලෙමි. පසුදින උදෑසන වන විටදීත් මට පැන්සලක් ලැබුනේ නැත. මා පැන්සලක් නොමැතිව එදින පාසලට ගියෙමි. අනෙක් ළමුන් සියලුදෙනාම පැන්සලක්ද සමග පංතියට පැමිණි මුත් ගුරුතුමී පැවසූ ලෙස මා පැන්සලක් ගෙන ගියේ නැත. ගුරුතුමිය ඒ ගැන සතුටක් ප්‍රකාශ කලේ නැත. පසුදින පංතියට පැමිණෙන විට පැන්සලක් නොමැතිව එන්න එපා කියා පවසනු ලැබීය.



නැවත මා නිවසට ගිය පසුව ගුරුතුමිය පැවසූ දේ ගැන මවට ප්‍රකාශ කලෙමි. එවිට ඈ සිනාසි දිගටම යේසුස් වහන්සේට යාච්ඤා කරන්නය, ඔබගේ දෙවෙනි දවසේදී පැන්සලක් මග එනවාය කියා පවසනු ලැබීය. නමුත් එදිනද කිසිම දෙයක් සිදුවූයේ නැත. පසුදින මා පැන්සලක්ද නොමැතිව හිස් අතින්ම පාසලට ගියෙමි. මා පාසලට ගොස්, ''මා යාච්ඤා කලා. මගේ මව පැන්සලක් මග එනවා කියා කියුවා'' කියා ගුරුතුමියට පැවසු වෙමි. එවිට ගුරුතුමිය බොහෝ සේ කේන්ති ගොස් පැන්සලක් නොමැතිව පාසලට එන්න එපා කියා පවසනු ලැබීය.

මා ඉතාම දුක්බර හදවතකින් මේ පණිවිඩය මගේ මවට පැවසුවෙමි. එවිට ඇය, ''ඔබගේ පැන්සල ගැන යාච්ඤාව දෙවියන්වහන්සේ අසා තිබෙනවා'' කියා පැවසුවෙමි. එදින රාත්‍රියේදී මා දෙවියන්වහන්සේට ස්තුති කලෙමි. නමුත් පසුදින පැන්සලක් නොමැතිව පාසලට ගිය විට ලැබෙන්නට තිබෙන දඬුවම කුමක්ද කියන දේ


**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, **Post Box 2957**, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

ගැන හදවත තුල මහත් බරක්ව තිබුණි.

එදින මධ්‍යම රාත්‍රියේදී මාව පුදුමයට පත් කරමින් දොරට තට්ටුකරන හඬක් ඇසුනි. මේ රාත්‍රියේදී දොරට තට්ටුකරන්නේ හොරෙක් වෙන්න ඇති කියා සිතා මව සහ මා හැර කිසි වැඩිහිටියෙක් නිවසේ නොමැති නිසා ශබ්දයක් නොකර අප නිදාගත්තෙමුව.

පසුව ජනේලය ළගට පැමිණ මගේ මවගේ නම කියා කථා කරන්නාවූ හඬක් අපට ඇසුනි. එය මාගේ මවගේ සහෝදරයාගේ කටහඬයි. ඔහු පාලෙයම්කෝට්ටෙයි යන පොලීසියෙහි සේවය කලේය. අප ඉතාම සතුටින් යුතුව දොර ඇරියෙමි. ඔහු මට බිස්කට්, ඇඳුම් සහ පැණි රස කැවිලි ආදිය හැමදාම ගෙනෙන පරිදි ගෙනවිත් තිබුණි. ඒවා අතර එක් පෙට්ටියක් තිබෙන බව මා දුටුවෙමි. මා ඉතාම ආශාවෙන් එය ඇර බැලුවෙමි. එම පෙට්ටිය ඇතුලෙහි ඉතාම වටිනාවූ පැන්සල් 24 ක් තිබුණි. එවිට මා උඩ පනිමින් දෙවියන්වහන්සේ මගේ යාච්ඤාවට පිළිතුරු ලබා දුන්නේය කියා ස්තුති කලෙමි. ඒ රාත්‍රියේදී මා නිදාගත්තේද නැත.

පසුදින මා පාසලට ගියේ පැන්සල් 24 කින් සමන්විත වූ පැන්සල් පෙට්ටියක් සමගයි. අනෙක් ශිෂ්‍යයින්ට තිබුනේ එක් පැන්සලක් නමුත් මට පැන්සල් 24 කින් යුත් පැන්සල් පෙට්ටියක්ම තිබුණි. ගුරුතුමිය මා වෙතට පැමිණ මොනවාද වුනේ කියා ඇඃ මගෙන් ඇසුවෙමි. එවිට මා පිළිතුරු දෙමින්, ''පැන්සල් මග එනවා කියා මා ඊයේ කියුවාක් මෙන් එය අද මා අතට ඉතා පුදුමාකාර මාර්ගයකින් ලැබුණි'' කියා පැවසුවෙමි. ඇය ඉතා ප්‍රීතියෙන් මගේ පිටට තට්ටු කර මේ දරුවා ජීවමානවූ දෙවියන්වහන්සේව විශ්වාස කලා එයට මෙය මහත් සාක්ෂියක්ය කියා ශිෂ්‍යයින්ට ප්‍රකාශ කලේය. ඒ

RNI NO. TN/SIH/2006/17846

නාමය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

ප්‍රිය පාඨකයනි, මේ වන විට මගේ වයස අවුරුදු 7 කි. නමුත් එම අත්දැකීම මගේ හදවතෙහි තවමත් නැවුම්ව පවතී. මට එම පැන්සල් දුන් දෙවියන්වහන්සේ ජීවමානව සිටී. ***''යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් අදත් සදාකාලයටත් ඒකාකාරමය.'' (හෙබ්‍රෙව් 13:8)*** අද දක්වාම මගේ කාමරයෙහි කුඩා පැදුරක් මා තබා තිබේ. මා ඒ ගැන, මා එම පැදුරෙහි දවසකට තුන් වතාවක් දණගසා යාච්ඤා කරනවා දෙවියන්වහන්සේ මට අවශ්‍ය සෑම දෙයක්ම සපයන්න කියා. මා යේසුස් වහන්සේට කල යාච්ඤාවන් කරණකොට ගෙන විශාල ගොඩනැගිලි, බොහෝ වාහන මේ පැදුරේ සිට යාච්ඤා කර ලබා ගෙන තිබුණි. මා මගේ ජීවිතයෙන් ඔබට දෙන පණිවිඩය නම්, බයිබලය උසුලාගෙන යන දෑතද දණගසා යාච්ඤා කරන කකුල්ද කිසි විටෙක පරාජයට පත්වන්නේ නැත.

පසුගිය වසර 55 තුලදී මෙම කැඳවීමේ ප්‍රතිරාවය සේවයේදී මා කිසි කෙනෙකු වෙතට ගොස් මුදල් ලබා දෙන්නය කියා ඉල්ලා නැත. නමුත් දෙවියන්වහන්සේ මට සියලු දේ සපයයි. මගේ යාච්ඤාවට පිළිතුරු දෙයි. එම පැන්සල් පැදුරේ සිට යාච්ඤා කරන්නාවූ සියලුදේම මට ලැබෙයි.

*''මා බලවත් කරන්නාවූ තැනැන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන.'' (පිලිප්පි 4:13)*

*************

**Echo of His Call**

**YouTube**
Please subscribe

Kindly view and subscribe our **Echo of His Call YouTube Channel** when you get time. Thanks.
- Editor

# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd **NOVEMBER 2024.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
Chepauk, Chennai - 600 005, INDIA.
Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**